# අතීත අභිකුණ්ඨක ජනතාවගේ වර්තමාන වෙනස් වීම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.ඊ.ඩී.කේ. මුණසිංහ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Ssh2020292@ssh.rjt.ac.lk

**මුඛ්‍ය පද** - අභින්කුණ්ඨක ජනතාව, ජීවන තත්ත්වය වෙනස් වීම

## හැඳින්වීම

අභිකුණ්ඨකයා යනු තැනින් තැන වාඩි ගසාගෙන නයි නැටවීම සාස්තර කීම ආදි ජීවනෝපායන්ගෙන් යැපෙමින් සැහැල්ලු, සංචාරක ජීවිතයක් ගත කරන ජන කොට්ඨාසයක් ය. ලක්දිව සෑම පළාතක ම පාහේ මෙන්ම උතුරුමැද, නැගෙනහිර හා සබරගමුව, දකුණ යන පළාත්වල නිරන්තරව ද මොවුන් දක්නට ලැබේ. අභිකුණ්ඨක ජනතාව ඉන්දියාවේ සිට මෙරටට සංක්‍රමණය වූ අනාර්යය ජන කොට්ඨාසයක් ලෙස සැලකේ. ජංගම ජීවිතයකට කැප වූ අභිකුණ්ඨකයා තමා හා තම නයින් අව් වැස්සෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තාවකාලික නිවාසයක් තනා ගනු ලබන්නේ තල් අතු එකට තබා මැසීමෙනි. ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින අභිකුණ්ඨීක කුප්පායම් අතර ද සංවිධානයක් ඇත. දීපාවලි සමයෙහි දී ශ්‍රී ලංකාවේ වසන සෑම අභිකුණ්ඨීක කුලයක් ම ඔවුන්ගේ ගෝත්‍ර මූලස්ථානය වන කැකිරාව අසල පිහිටි, කච්චිදුව නම් ස්ථානයට වරක් පාසා එක්රැස් වෙති. තම ගෝත්‍රයට බලපාන පොදු ප්‍රශ්න සියල්ල නිරාකරණය කර ගනී. එසේම එහි දී කුල අතර කෙරෙන ආවාහ විවාහ ගිවිසුම් පිළිබඳව සම්මුතිවලට ද එළඹෙති. මිල මුදල් හා වෙනත් ගනුදෙනු ගැන තීරණ ගැනීමට ද ඉදිරි වර්ෂයේ එක් එක් කුප්පායමේ ගමන් මාර්ගය ආදිය ගැන කතිකා කර ගැනීම ද එහි දී සිදු කෙරේ. අතීතයේ සිට වර්තමානය දක්වා අභිකුණ්ඨකයන් හට සිදු වූ වෙනස් වීම් වර්ථමානය වන විට ඔවුන්ගේ තත්ත්වය කෙසේ ද යන්න මෙහි පරීක්ෂණ ගැටළුව වේ. ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨීකයන් අතර ප්‍රචලිත ආගමික ඇදහිලි විමසා බලන කල්හි ඔවුන් දැනට ලක්වාසීන් අතර සම්මතව පවත්නා පිළිගත් ආගම් අතරින් අසවල් ආගමට අයත් යැයි එක එල්ලේම නිගමනය කිරීම අපහසු ය. ඔවුන්ගේ ජීවන උපාය අභිකුණ්ඨීක පිරිමියා නයි නැටවීමෙන් මුදල් උපයන අතර ගැහැණියගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ අත බලා සාස්තර කීමයි. අභිකුණ්ඨීකයන්ගේ ආරම්භය, ගෝත්‍ර සංවිධානය, ආගමික විශ්වාස, ජීවන උපාය, අවාහා විවාහ, භාෂාව අධිකරණය මෙන්ම අභිකුණ්ඨීකයන්ගේ අනාගතය මෙම පරීක්ෂණය තුළින් අධ්‍යයනය කිරීම අරමුණු වේ.

## ක්‍රමවේදය

යථෝක්ත පරීක්ෂණ ගැටලුව විසදා ගැනීමේ ආරම්භක පියවර වශයෙන් ශ්‍රී ලංකාවේ සිටි ජන වර්ග පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇති අතර අනතුරුව සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු එක්රැස් කිරීමක් සිදු කරන ලදී. අභිකුණ්ඨීක ජනතාව පිළිබඳව මේ වන විට පූර්ව පරීක්ෂණයන් විසින් අනාවරණය කරනගෙන ඇති දත්ත විමර්ශනාත්මකව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අදාල ජන කොට්ඨාසය පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

නයි නටවන, රිලවුන් නටවන සාස්තර කියන සුවිශේෂි වූ පිරිස් දැක ඇති මුත් ඔවුන්ගේ ප්‍රභවය, සුවිශේෂි ජන කොටසක් වශයෙන් ඔවුන්ට ආවේණික වූ ලක්ෂණ, ඇඳුම් පැළඳුම්, වත් පිළිවෙත් සහ කලා ශිල්පයන් ආදී ආවේණික ලක්ෂණයන්ගෙන් ඔවුන් ශ්‍රී ලාංකීය ජන සමාජයෙහි සුවිශේෂි ජන කොට්ඨාසයක් යන බව මෙම පරීක්ෂණය තුළින් සාකච්ඡා කෙරේ. සාහිත්‍ය මූලාශ්‍ර තුළින් ඔවුන්ගේ ජන සමාජයේ ආරම්භය පිළිබඳ අධ්‍යයනය කරන ලදී. ඒ

තුළින් මොවුන් දකුණු ඉන්දියාවේ ආරම්භක ජන කොටසක් ලෙස හඳුනාගත හැක. අහිකුණ්ඨික සමාජය පිළිබඳ කරුණු ආවරණයේ දී,

- ගෝත්‍ර සංවිධානය
- අහිකුණ්ඨික අධිකරණ රටාව
- නිවාස සහ ගෘහ උපකරණ
- ජීවනෝපාය

ආදී කොටස් පිළිබඳව අවධානය වැඩි වශයෙන් යොමු කරයි. අතීතයේ සිට වර්තමානය වන විට ඔවුන්ගේ ජීවන ක්‍රමය තුළ අහිකුණ්ඨික පිරිමි පුද්ගලයන් නයි නැටවීමෙන් ද, රිලවු නැටවීමෙන් ද හොරකමින් සහ දඩයමින් ජීවත් වන අය ලෙස ද අහිකුණ්ඨික කාන්තාවන් අත බලා ශාස්ත්‍ර කීමෙන් ද අහිකුණ්ඨික කුඩා ළමුන් "ඩිංග" ගැසීම තුළින් ද තම ජීවිතය රැක ගැනීමට යමක් කමක් සොයා ගැනීමට තැනින් තැන සංචාරය කරයි. ශ්‍රී ලාංකීය අහිකුණ්ඨික ප්‍රජාව සහ ඉන්දියාවේ වෙසෙන "කුරවර්" හෙවත් "කොරවර්" ගෝත්‍රයන් බෙහෙවින් සමාන ලක්ෂණ පෙන්වයි. එමෙන් ම ශ්‍රී ලංකා අහිකුණ්ඨිකයන් භාවිතා කරනු ලබන භාෂාව තෙළිඟු භාෂාවෙන් පෝෂණය ලද ඔවුන්ටම අනන්‍ය භාෂාවක් ලෙස ද පෙන්වා දිය හැක.

විවෘත ආර්ථිකය, කාර්මීකරණය, තාක්ෂණයෙහි දියුණුව ආදි හේතූන් නිසා සංස්කෘතිය නම් වූ ජාතිකත්වය සම්බන්ධ මූලිකාංගයන් වෙනස් වීමට බලපායි. ඕනෑම ප්‍රධාන සංස්කෘතියක් තුළ ඒවා හා සම්බන්ධ උප සංස්කෘතීන් පවතියි. උක්ත මාතෘකානුකූල ප්‍රජාව වනාහි පවතින සමාජ ක්‍රමයට අනුගත වීමට උත්සහ කරන සමාජ කොට්ඨාසයකි. එමනිසා ඔවුන් සතු වූ බස් වහර, සිරිත් විරිත්, ජීවනෝපාය ආදී වූ ආවේණික සංස්කෘතික ලක්ෂණ ඔවුන් අතරින් දුරස්ථව පවතියි. ඔවුන් හඳුන්කූරු තැනීම, කතුරු මුවහත් කිරීම වැනි වෘත්තීන් මගින් ඔවුන්ගේ ජීවිකාවන් කරගෙන යෑමට අපේක්ෂා කරයි.

ජනගහනය වැඩිවීම, නවීකරණය, නාගරීකරණය ඉඩම් කැබලි වීම ආදිය නිසා ඔවුනට සාම්ප්‍රදායික හැසිරීම් පද්ධතිය ආරක්ෂා කිරීමට බාධක ගොඩනැගිණි. අතීතයේ පටන්ම අහිකුණ්ඨික ජනයා සංක්‍රමණ ජීවිතයෙන් මුදවා ස්ථිර නිවාසවල රැඳවීමට විවිධ රජවරුන් ගත් උත්සහයන් ගැන ඉතිහාසයේ දැක් වේ. කෙසේ වෙතත් වර්තමානයේ ඇති වී තිබෙන තත්ත්වයන් යටතේ ඔවුන් වේගයෙන් මහා සමාජය හා අනුගත වෙමින් පවතියි. රජය විසින් ද මොවුන් මහා සමාජයට අනුගත කිරීමට නොයෙක් උත්සහයන් දරා ඇත. 1980න් පසු අහිකුණ්ඨික ප්‍රජාවට මහවැලි ව්‍යාපාරය යටතේ ස්ථිර ඉඩම් ලබා දී ගොවිතැනට හුරු කිරීමට කටයුතු කළහ. අපනයන සැකසුම් කලාප ඉදිවීමත් සමඟ අහිකුණ්ඨික කාන්තාවන්ට රැකියා ලැබීම ඇතමුන් විදේශ සේවයට යොමු වීම හා අහිකුණ්ඨික තරුණයින් යුධ හමුදා සේවයට බැඳීම සිදු විය. මොවුන් තවදුරටත් තම සාම්ප්‍රදායකත්වයෙන් මිදී මහා සමාජයට අනුගත වීම වේගයෙන් සිදු වෙමින් පවතියි. මෙම පරීක්ෂණයේ අවසාන නිගමනය බවට පෙන්වා දිය හැක්කේ අතීතයේ ජීවත් වූ අහිකුණ්ඨික ජනතාවගේ සමාජ ක්‍රමය වර්තමානයේ ඇති වී තිබෙන නවීකරණයත් සමඟ වෙනස් වී ඇති බවය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ධර්මදාස, කේ. එන්. ඕ. (1985). ***"අහිකුණ්ඨික ජනයා" මහවැලිවංශය 2 කාණ්ඩය***, රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව.

බණ්ඩාර, තිබ්රියාගම හා තවත් අය, (2007). ***ජනවිවිධත්වය***, මහරගම රාවය පබ්ලිකේෂන්.